සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 13 ශ්‍රේණිය, අවසාන වාර පරීක්ෂණය, 2019 ජූලි

General Certificate of Education (Adv. Level), Grade 13, Year End Test, July 2019

**දේශපාලන විද්‍යාව - I**
**Political Science - I**

23 S I

පැය දෙකයි
Two hours

විභාග අංකය : ..............................................

සැලකිය යුතුයි.

- මෙම ප්‍රශ්න පත්‍රය A සහ B යනුවෙන් කොටස් දෙකකින් සමන්විත වන අතර A කොටස බහුවරණ ප්‍රශ්න 30කින් සහ B කොටස කෙටි ප්‍රශ්න 20 කින් යුක්ත වේ.
- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සැපයිය යුතු ය.
- එක් පිළිතුරකට ලකුණු දෙකක් බැගින් මුළු ලකුණු 100කි.

## A කොටස

- අංක 01 සිට 05 තෙක් ඇති ප්‍රශ්නවලට වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

01. "රාජ්‍යය සමස්ත සමාජයේ සියලු දෙනාගේ ම ආශාවන් හා අවශ්‍යතා වෙනුවෙන් පෙනී සිටියි." යන ප්‍රකාශය,
(1) සමාජ සම්මුතිවාදීන්ගේ අදහසකි.
(2) මාක්ස්වාදී අදහසකි.
(3) ලිබරල්වාදී අදහසකි.
(4) පැසිස්ට්වාදී අදහසකි.
(5) දේවවරම්වාදී අදහසකි.
(......................)

02. රාජ්‍යය පනවන නීතිවලට පුරවැසියා අවනත විය යුත්තේ ඇයි ද යන්න සම්බන්ධයෙන් සමාජ සම්මුතිවාදීන් ඉදිරිපත් කළ අදහස තෝරන්න.
(1) රාජ්‍යයේ අවසාන අරමුණ සියලු දෙනාට සදාචාර සම්පන්න ජීවිතයක් ලබා දීමට කැප වීම නිසා.
(2) රාජ්‍යය තුළින් පුරවැසියන්ගේ පොදු කැමැත්ත ප්‍රකාශ වන නිසා.
(3) රාජ්‍යය සමඟ එකඟ වීමට පුරවැසියාට ගිවිසුමක් ඇති නිසා
(4) රාජ්‍යය පන්ති ආයුධයක් ලෙස ක්‍රියාත්මක වන නිසා
(5) සමස්ත සමාජයේ සියලු දෙනාගේ ම ආශාවන් හා අවශ්‍යතා වෙනුවෙන් පෙනී සිටීම. (......................)

03. රාජ්‍ය පරිපාලනය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) දෙවන ලෝක යුද්ධයෙන් පසුව දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රයට එක් වූ කොටසකි.
(2) පෞද්ගලික ආයතනවල පරිපාලනය මීට අයත් වේ.
(3) නිර්බාධවාදී රාජ්‍යය ක්‍රමය යටතේ වර්ධනය වන්නකි.
(4) රාජ්‍ය නීතිය ඉක්මවා ක්‍රියාත්මක වන්නකි.
(5) ව්‍යාපාරිකයන් ලාභ ඉපයීම සඳහා කරනු ලබන ක්‍රියාවකි. (......................)

04. රාජ්‍ය හා පුරවැසියා අතර සම්බන්ධය ප්‍රකාශ නොවන වගන්තිය තෝරන්න.
(1) රාජ්‍යයේ සාමාජිකත්වය හිමි තැනැත්තා පුරවැසියා ලෙස හඳුන්වයි.
(2) රාජ්‍යය පාලන කටයුතුවලට සෘජුව හෝ වක්‍රව සම්බන්ධ වන්නෙකි.
(3) ග්‍රීක නාගරික රාජ්‍යය තුළ ජීවත් වූ සියලු දෙනා පුරවැසියන් ලෙස නොසැලකූහ.
(4) පුරවැසියාට රාජ්‍ය අවනතභාවය දැක්විය යුතුය. (....................)
(5) පුරවැසියා රාජ්‍යය ගොඩනගා ඇත්තේ සිය අවශ්‍යතා ඉටුකර ගැනීමට ය.

05. සමකාලීන තුලනාත්මක දේශපාලන අධ්‍යයන ප්‍රවේශය මගින් අධ්‍යයනය කරන පැතිකඩ නොවන්නේ,
(1) ස්ත්‍රීන්ගේ දේශපාලන සහභාගිත්වය
(2) දේශපාලන ආයතන
(3) පුරවැසි ක්‍රියාකාරිත්වය
(4) මානව අයිතිවාසිකම් (....................)
(5) ආණ්ඩුක්‍රම සැසඳීම.

- **අංක 06 සිට 20 තෙක් ඇති ප්‍රශ්න සඳහා ඒ ඒ ප්‍රශ්නයේ මාතෘකාවට අදාළ ව ප්‍රකාශ පහක් දක්වා ඇත. ඒවායින් නිවැරදි වන්නේ ප්‍රකාශ හතරක් පමණි. නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.**

06. ස්ත්‍රීවාදී ප්‍රවේශය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය කාණ්ඩය තෝරන්න.
A - එහි අරමුණ කාන්තා විමුක්තිය ගොඩ නැගීමයි.
B - පිරිමින්ට පක්ෂපාතී සමාජ ක්‍රමය විවේචනය කරයි.
C - ස්ත්‍රී පුරුෂ සමාජභාවය රාජ්‍යයන් හි ඇති ව තිබෙන සියලු ප්‍රශ්න සඳහා හේතු වී ඇත.
D - පුරුෂාධිපත්‍යය තුරන් කිරීමේ වැදගත් බව පිළිගනී.
E - ස්ත්‍රීවාදී ප්‍රවේශය අනෙකුත් අධ්‍යයන ප්‍රවේශ හා සම්බන්ධ නොවේ.
(1) ABCD (2) BCDE (3) CDEA (4) DEAB (5) EABC (....................)

07. **දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රයට අදාළ වන ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.**
A - දේශපාලන දර්ශනය
B - නිදහස් බල අරගලයකි.
C - ගැටුම් නිරාකරණය
D - තුලනාත්මක දේශපාලනය
E - දේශපාලන මතවාද
(1) ABCD (2) BCDE (3) CDEA (4) DEAB (5) EABC (....................)

08. දේශපාලන අර්ථ ශාස්ත්‍රීය ප්‍රවේශය වර්ධනය සඳහා දායක වූ අය ඇතුළත් ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.
A - කාල් මාක්ස්
B - ඇඩම් ස්මිත්
C - ජෝන් ස්ටුවට් මිල්
D - ප්ලේටෝ
E - ඩේවිඩ් රිකාඩෝ
(1) ABCD (2) BCDE (3) CDEA (4) DEAB (5) EABC (....................)

09. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය ක්‍රමය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.
A - පුරවැසියාගේ යහපත වෙනුවෙන් කටයුතු කරයි.
B - පුද්ගල නිදහස අගය කරයි.
C - අයිතිවාසිකම් ලබා දෙයි.
D - පාලිතයන් පමණක් නීතියට යටත් විය යුතුය.
E - මහජනතාව උත්තරීතර කොට සලකයි.
(1) ABCD (2) BCDE (3) CDEA (4) DEAB (5) EABC (....................



Scanned with CamScanner

10. දේශපාලන ආයතනයන් වන්නේ,

A - රාජ්‍යය
B - බලපෑම් කණ්ඩායම්
C - සිවිල් සමාජය
D - ආණ්ඩුව
E - බහුජාතික සමාගම්

(1) ABCD (2) BCDE (3) CDEA (4) DEAB (5) EABC (..................)

11. දේශපාලන විද්‍යාව අධ්‍යයනයට අදාළ ආණ්ඩු වන්නේ,

A - ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු
B - ධනවාදී ආණ්ඩු
C - ඒකීයවාදී ආණ්ඩු
D - ප්‍රාදේශීය ආණ්ඩු
E - සමූහාණ්ඩුවාදී ආණ්ඩු

(1) ABCD (2) BCDE (3) CDEA (4) DEAB (5) EABC (..................)

12. සංධීය ආණ්ඩුක්‍රමය,

A - විවිධ මට්ටම් සහිත ආණ්ඩු අතර සිරස් ආකාරයට බලය හුවමාරු කර ගැනීමේ පදනම මත ගොඩනැගී ඇත.
B - බලතල බෙදීමේ තවත් ක්‍රමයක් ලෙස සලකනු ලැබේ.
C - විවිධ වාර්ගික ජන කොටස් එක් දේශපාලන ක්‍රමයක් අනුගත කරවීම සඳහා ප්‍රයෝජනවත් වේ.
D - විවිධත්වය තුළ ඒකීයත්වය බද්ධ කරන ක්‍රමයක් ලෙස විග්‍රහ කර ඇත.
E - සජාතීය සමාජ ක්‍රම පවතින රටවල් සඳහා වඩාත් යෝග්‍ය බව පිළිගනු ලැබේ.

(1) ABCD (2) BCDE (3) CDEA (4) DEAB (5) EABC (..................)

- පහත දක්වෙන කරුණුවලට අනුව 13, 14 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - රාජ්‍යයේ ස්වාධිපත්‍ය බලය මධ්‍යම ආණ්ඩුව වෙත කේන්ද්‍රගතව පවතී.
B - බලතල බෙදා දක්වා ඇත.
C - පළාත් පාලන ආයතන හරහා බලතල විමධ්‍යගත කොට ඇත.
D - බහුවාර්ගික ජන සමාජයන් සඳහා වඩාත් යෝග්‍යය.
E - ඒකීය පරිපාලන හා අධිකරණ ක්‍රමයක් පවතී.
F - උත්තරීතර ලිඛිත ව්‍යවස්ථාවක් පැවතීම.

13. ඒකීය ආණ්ඩු ක්‍රමයට අදාළ කාණ්ඩය වනුයේ,

(1) ABC (2) DEF (3) BCD (4) ACE (5) AEB (..................)

14. සංධීය ආණ්ඩු ක්‍රමයට අදාළ කාණ්ඩය වනුයේ,

(1) CDA (2) BCF (3) DBC (4) ABD (5) BDF (..................)

15. ආණ්ඩුකරණයට අයත් කාර්යයන් වනුයේ,

A - නීති සම්පාදනය
B - නීතිය හා සාමය ආරක්ෂා කිරීම.
C - ගැටුම් කළමනාකරණය
D - ශිෂ්‍ය අරගල සංවිධානය
E - රාජ්‍ය පරිපාලන කාර්යයන්

(1) ABCD (2) BCDE (3) CDEA (4) DEAB (5) EABC (..................)



Scanned with CamScanner

16. පුරවැසියකු ඉටු කරන දේශපාලන භූමිකාවක් වන්නේ,

A - සන්නද්ධ අරගල

B - ඡන්දය භාවිත කිරීම.

C - කැමති ආගමක් ඇදහීම.

D - දේශපාලන පක්ෂ සාමාජිකයෙකු වීම.

E - ත්‍රස්තවාදී අරගල

(1) ABCD (2) BCDE (3) CDEA (4) DEAB (5) EABC (......................)

17. දේශපාලනය හැදෑරීම යන්නට අයත් සංකල්ප වනුයේ.

A - දේශපාලන භාවිතයන්

B - ආණ්ඩුකරණය

C - දේශපාලන චර්යාවන්

D - මැතිවරණවලට ඉදිරිපත් වීම.

E - දේශපාලන මතවාදයන්

(1) ABCD (2) BCDE (3) CDEA (4) DEAB (5) EABC (......................)

18. දේශපාලන විද්‍යාවේ ස්වභාවය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

A - මානව ගුණදම් අධ්‍යයනය කරයි.

B - එය බලය පිළිබඳ අධ්‍යයනය කරන විෂයය වේ.

C - සමාජීය විද්‍යාවන්හි මූලිකයා ය.

D - නිරන්තරයෙන් වර්ධනය වන විෂයයකි.

E - වෙනස්වීම්වලට භාජනය වන විෂයයකි.

(1) ABCD (2) BCDE (3) CDEA (4) DEAB (5) EABC (......................)

19. චර්යාවාදී අධ්‍යයන ක්‍රමයේ ලක්ෂණ ඇතුළත් පිළිතුරු කාණ්ඩය තෝරන්න.

A - සම්ප්‍රේෂණය හා සිතා ගැනීම් පදනම් කරගත් අධ්‍යයන ක්‍රමයකි.

B - ඇමරිකානු දේශපාලන විද්‍යා කණ්ඩායමක් විසින් වර්ධනය කර තිබේ.

C - දේශපාලනය අධ්‍යයනය කිරීම සඳහා පැවැති සම්ප්‍රදායික අධ්‍යයන ක්‍රමවලට ප්‍රතික්‍රියාවක් ලෙස පැනනැගුණි.

D - ප්‍රත්‍යක්ෂ මූලික සාධක මත විද්‍යාත්මක ක්‍රම යොදා ගනිමින් දේශපාලන අධ්‍යයනය කළ යුතු බව එමගින් අවධාරණය කෙරේ.

E - අනවශ්‍ය අගය කිරීම් වලින් තොර බව

(1) ABCD (2) BCDE (3) CDEA (4) DEAB (5) EABC (......................)

20. රාජ්‍ය පරිපාලනයට අයත් ක්‍රියාවක් වන්නේ,

A - සැලසුම් කිරීම

B - සංවිධානය කිරීම

C - ක්‍රියාවට නැංවීම

D - අයිතිවාසිකම් ඉදිරිපත් කිරීම

E - සම්බන්ධීකරණය

(1) ABCD (2) BCDE (3) CDEA (4) DEAB (5) EABC (......................)



Scanned with CamScanner

- අංක 21 සිට 30 දක්වා ප්‍රශ්නවල සඳහා ඇති ප්‍රකාශ පහ අතුරින් හතරක් පමණක් නිවැරදි වේ. නිවැරදි ප්‍රකාශ ඇතුළත් කාණ්ඩය තෝරන්න.

21. බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනය යටතේ ලංකාවට,
   A - ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමය හඳුන්වා දුන්නේය.
   B - සර්වජන ඡන්ද බලය හඳුන්වා දුන්නේය.
   C - බටහිර අධ්‍යාපන ක්‍රමය හඳුන්වා දුන්නේය.
   D - ජනපද ආණ්ඩුක්‍රමය හඳුන්වා දුන්නේ ය.
   E - වෙළඳපොළ ආර්ථික ක්‍රමය හඳුන්වා දුන්නේ ය.
   (1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......................)

22. කෝල්බෲක් කොමිසමේ මූලික යෝජනා වූයේ,
   A - රාජකාරී ක්‍රමය අහෝසි කිරීම.
   B - විධායක ව්‍යවස්ථාදායක සභා ඇති කිරීම.
   C - සීමිත ඡන්ද බලය හඳුන්වා දීම.
   D - රජයේ වෙළෙඳ ඒකාධිකාරය අහෝසි කිරීම.
   E - ඉඩම් විකිණීමේ ප්‍රතිපත්තියක් ඇති කිරීම.
   (1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......................)

23. ලංකා ජාතික සංගමය,
   A - 1919 දී පිහිටුවීම
   B - වාර්ගික හා ප්‍රාදේශීය කණ්ඩායම් නියෝජිත එකතුවකි.
   C - අභ්‍යන්තර භේද හේතු කොට ගෙන ශක්තිමත් සංවිධානයක් නොවිය.
   D - සමාජයේ සෑම ආර්ථික හා සමාජ කණ්ඩායමක්ම එක්තැන් වූ ජනතා ව්‍යාපාරයක් විය.
   E - ඉංග්‍රීසි භාෂාව උගත් ධනවත් මධ්‍යම පාන්තිකයන් නායකත්වය දැරූ ව්‍යාපාරයක් විය.
   (1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......................)

24. ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ මූලික යෝජනා වූයේ,
   A - සර්වජන ඡන්ද බලය
   B - රාජ්‍ය මන්ත්‍රණ සභාව
   C - සිවිල් නිලධාරීන් තිදෙනා
   D - විධායක කාරක සභා ක්‍රමය
   E - ඡන්ද කොට්ඨාස පදනමෙන් නියෝජිතයන් 61ක් තෝරා ගැනීම.
   (1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......................)

25. සෝල්බරි ආණ්ඩුක්‍රමයේ මූලිකාංග වන්නේ,
   A - ද්විමණ්ඩලික ව්‍යවස්ථාදායකය
   B - බ්‍රිතාන්‍ය කිරීටයේ නායකත්වය සහිත ආණ්ඩුක්‍රමය
   C - නීති සම්පාදනයේ පූර්ණ බලය සහිත ව්‍යවස්ථාදායකයක් පැවතීම.
   D - බ්‍රිතාන්‍ය රාජාධිකරණය මුල් තැන ගත් අධිකරණ ක්‍රමය
   E - අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය සත්‍ය විධායකය ලෙස කටයුතු කිරීම.
   (1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......................



Scanned with CamScanner

26. සෝල්බරි ව්‍යවස්ථාව අනුව අග්‍රාමාත්‍යවරයා.
A - ආණ්ඩුකාරයා විසින් පත් කළේ ය.
B - රාජ්‍ය නායකයා විය.
C - ව්‍යවස්ථාදායකයට වගකිව යුතු විය.
D - කැබිනට් මණ්ඩලය නම් කිරීමේ පූර්ණ බලය තිබිණි.
E - ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශය භාරව ක්‍රියා කරන ලදී.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (..........)

27. 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව.
A - ඒක මණ්ඩලික විය.
B - නීති සම්පාදන බලය උත්තරීතර විය.
C - ජාතික රාජ්‍ය සභාව නම් විය.
D - වසර 06 ක නිල කාලයකින් සමන්විත විය.
E - සාමාජිකයන් 190කින් සමන්විත විය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (..........)

28. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිවරයා.
A - සන්නද්ධ සේවාවන්හි සේනාධි නායකයා වේ.
B - කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා නොවේ.
C - ව්‍යවස්ථාවට අනුව පාර්ලිමේන්තුවට වගකීමට බැඳී සිටී.
D - අගමැති ඇතුළු කැබිනට් මණ්ඩලය පත් කරනු ලබයි.
E - පාර්ලිමේන්තු මහලේකම්වරයා පත් කරනු ලබයි.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (..........)

29. පළාත් සභා ක්‍රමය.
A - 13 වන ව්‍යවස්ථා සංශෝධනය මඟින් පිහිටුවන ලදී.
B - 1987 ඉන්දු ලංකා ගිවිසුමේ එකඟතාවයන්ට අනුව පිහිටුවන ලදී.
C - ශ්‍රී ලංකාවේ ජනවාර්ගික අර්බුදයට එක් විසඳුමක් ලෙස පිහිටුවන ලදී.
D - එක් පළාතකට එක බැගින් පිහිටුවා ඇත.
E - පළාත් මහ ඇමතිවරයා විසින් ආණ්ඩුකාරවරයා පත් කරයි.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (..........)

30. 1978 ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය.
A - මූලික නීතිය යටතේ පිහිටුවා ඇත.
B - අධිකරණ පද්ධතියේ ඉහළම අධිකරණය වන්නේ ය.
C - සමන්විත වන්නේ අගවිනිසුරු සහ තවත් විනිසුරුවන් 6 - 10 අතර ප්‍රමාණයකින් ය.
D - ජවනීය තීරණ සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට වගකිව යුතුය.
E - ජනාධිපතිවරයාට උපදේශාත්මක මත ලබා දීමට බැඳී සිටියි.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (..........)



Scanned with CamScanner

## B කොටස

31. දේශපාලන විද්‍යාව යනු ශාස්ත්‍රීය ලෙස හදාරන විෂයකි. එහි දී වැදගත් වන ප්‍රවේශ දෙකකි. ඒවා නම් කරන්න.

(1) ..............................................................................................................................

(2) ..............................................................................................................................

32. දේශපාලනය හැදෑරීම අර්ථ දෙකක් යටතේ හඳුනාගත හැකි ය. ඒවා නම් කරන්න.

(1) ..............................................................................................................................

(2) ..............................................................................................................................

33. දේශපාලන විද්‍යා විෂය ක්ෂේත්‍රයට අදාළ දේශපාලන න්‍යාය සංකල්ප අර්ථ දෙකකි. ඒවා නම් කරන්න.

(1) ..............................................................................................................................

(2) ..............................................................................................................................

34. දේශපාලන විද්‍යා අධ්‍යයන ප්‍රවේශයක් ලෙස දාර්ශනික අධ්‍යයන ප්‍රවේශය සතු මූලික ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

(1) ..............................................................................................................................

(2) ..............................................................................................................................

35. රාජ්‍ය පිළිබඳ සමාජ සම්මුතිවාදය පිළිබඳ ව පහත සඳහන් චින්තකයන් විසින් රචනා කරන ලද ග්‍රන්ථ දෙක නම් කරන්න.

(1) තෝමස් හොබ්ස් - ..............................................................................

(2) ජෝන් ලොක් - ..............................................................................

36. ගැටුම් ජීවන චක්‍රයේ (Conflict life cycle) අවධීන් දෙකක් නම් කරන්න.

(1) ..............................................................................................................................

(2) ..............................................................................................................................

37. නූතන ජාතික රාජ්‍ය සතු මූලික අංග ලක්ෂණ දෙකක් නම් කරන්න.

(1) ..............................................................................................................................

(2) ..............................................................................................................................

38. ජාතිකවාදය ප්‍රධාන ප්‍රවේශ තුනක් ඔස්සේ හඳුනාගත හැකි ය. ඉන් දෙකක් නම් කරන්න.

(1) ..............................................................................................................................

(2) ..............................................................................................................................

39. පහත සඳහන් ග්‍රන්ථ රචනා කරන ලද කතෘවරුන් දෙදෙනා නම් කරන්න.

(1) සමූහාණ්ඩුව - ..............................................................................

(2) ජාත්‍යන්තර ගැටුම්වල විග්‍රහය - ..............................................................................

40. ඉන්දියානු ආණ්ඩුක්‍රමයේ දක්නට ලැබෙන හදිසි අවස්ථා බලතල වර්ග දෙකක් නම් කරන්න.

(1) ..............................................................................................................................

(2) ..............................................................................................................................

41. ස්ත්‍රීවාදී චින්තනයේ ප්‍රධාන ධාරා දෙකක් නම් කරන්න.

(1) ..............................................................................................................................

(2) ..............................................................................................................................



Scanned with CamScanner

42. 1833 කෝල්බෲක් කැමරන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය යටතේ ආණ්ඩුකාරයාට සහාය සඳහා පිහිටි වූ ආණ්ඩුවේ ආයතන දෙක නම් කර ඒවායේ සංයුතිය ලියා දක්වන්න.

(1) ..................................................................................................

(2) ..................................................................................................

43. ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ ක්‍රියාත්මක වූ අමාත්‍ය මණ්ඩලය සමන්විත වූයේ දෙවර්ගයක අමාත්‍යවරුන්ගෙනි. ඒ අමාත්‍යවරු දෙවර්ගය නම් කරන්න.

(1) ..................................................................................................

(2) ..................................................................................................

44. රාජ්‍ය සේවය පාලනය කිරීම සඳහා 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිටි වූ මණ්ඩල දෙක නම් කරන්න.

(1) ..................................................................................................

(2) ..................................................................................................

45. (1) "ශ්‍රී ලංකා රාජ්‍යයේ අනාගමික ස්වරූපය ප්‍රථම වතාවට වෙනස් කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව"

(2) "ශ්‍රී ලංකාව වෙස්ට්මින්ස්ටර් ආකෘතියෙන් මිදීයාම සනිටුහන් කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව" පිළිවෙළින් නම් කරන්න.

(1) ..................................................................................................

(2) ..................................................................................................

46. (1) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ස්ථාපිත කරන ලද අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපති ධුරය.

(2) 19 වැනි සංශෝධනය මගින් ස්ථාපිත කරන ලද ව්‍යවස්ථා සභාවේ සභාපති ධුරය. නිලබලයෙන් ම හිමි වන තනතුරුවල නාමයන් පිළිවෙළින් ලියන්න.

(1) ..................................................................................................

(2) ..................................................................................................

47. 19 වැනි සංශෝධනය මගින් එතෙක් පැවැති කොමිෂන් සභාවලට අමතරව නව කොමිෂන් සභා ස්ථාපිත කරන ලදී. එම කොමිෂන් සභා දෙකක් නම් කරන්න.

(1) ..................................................................................................

(2) ..................................................................................................

48. (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එකතු කරන ලද 19 වැනි සංශෝධනය යටතේ පාර්ලිමේන්තුවට ඇති වගකීමෙන් නිදහස් කර ඇති කොමිෂන් සභාවේ නම ලියන්න.

(2) ජනාධිපතිවරයා විසින් එම කොමිෂන් සභාවට සාමාජිකයන් පත් කරනු ලබන්නේ කුමන ආයතනයක නිර්දේශය මත ද?

(1) ..................................................................................................

(2) ..................................................................................................

49. 17 හා 18 ව්‍යවස්ථා සංශෝධන මගින් හඳුන්වා දුන් විශේෂ සභාවන් දෙක නම් කරන්න.

(1) ..................................................................................................

(2) ..................................................................................................

50. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ, (1) ප්‍රධාන විධායක නිලධාරියා හා
(2) ප්‍රධාන සාකච්ඡා මණ්ඩලය පිළිවෙළින් ලියන්න.

(1) ..................................................................................................

(2) ..................................................................................................

Scanned with CamScanner

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 13 ශ්‍රේණිය, අවසාන වාර පරීක්ෂණය, 2019 ජූලි
General Certificate of Education (Adv. Level), Grade 13, Year End Test, July 2019

# දේශපාලන විද්‍යාව - II
# Political Science - II

23 S II

පැය 03යි
Three hours

විභාග අංකය : ..............................

සැලකිය යුතුයි.

- මෙම ප්‍රශ්න පත්‍රය I, II සහ III වශයෙන් කොටස් තුනකින් යුක්ත වේ. මෙම කොටස් වලින් ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමුවැනි කොටසින් යටත් පිරිසෙයින් එක් ප්‍රශ්නයක් ද, දෙවැනි කොටසින් යටත් පිරිසෙයින් ප්‍රශ්න දෙකක් ද, තුන්වෙනි කොටසින් යටත් පිරිසෙයින් එක් ප්‍රශ්නයක් ද වන සේ තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- II පත්‍රය සඳහා මුළු ලකුණු 100කි.

## I කොටස

(01) දේශපාලන විද්‍යාව යනු "ශාස්ත්‍රීය ලෙස දේශපාලනය හදාරන්නකි." විග්‍රහ කරන්න. (ලකුණු 20)

(02) පහත සඳහන් අධ්‍යයන ප්‍රවේශ දෙකක් පිළිබඳව විමර්ශනය කරන්න.

(1) දාර්ශනික අධ්‍යයන ප්‍රවේශය

(2) තුලනාත්මක අධ්‍යයන ප්‍රවේශය

(3) සමාජ විද්‍යාත්මක අධ්‍යයන ප්‍රවේශය

(4) ස්ත්‍රීවාදී ප්‍රවේශය (ලකුණු 10 × 2 - 20)

(03) පහත දක්වෙන ඕනෑම මාතෘකා දෙකක් පිළිබඳව අදහස් දක්වන්න.

(1) ග්‍රීක නාගරික රාජ්‍යය, වැඩවසම් රාජ්‍ය සහ ජාතික රාජ්‍ය ක්‍රමයේ මූලික ලක්ෂණ

(2) රාජ්‍යයේ ආරම්භය, ස්වභාවය සහ අනාගතය පිළිබඳ ලිබරල්වාදී මත හෝ මාක්ස්වාදී මතය

(3) සංඝීය ආණ්ඩුක්‍රමයක අත්‍යවශ්‍ය අංග ලක්ෂණ

(4) දේශපාලන පක්ෂ වර්ග කර ඇති ආකාරය (ලකුණු 10 × 2 - 20)

## II කොටස

(04) පහත දක්වෙන ඕනෑම මාතෘකා දෙකක් පිළිබඳව විස්තර කරන්න.

(1) කෝල්බෲක් කැමරන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණවල යහපත් හා අයහපත් ලක්ෂණ.

(2) ලංකා ජාතික සංගමයේ ආරම්භය හා පිරිහීම.

(3) 1911 - 1924 දක්වා ව්‍යවස්ථාදායක සභාවන්හි සංයුතියෙහි සිදු වූ වෙනස්කම්

(4) ලංකා සම සමාජ පක්ෂය බිහි වීමට බලපාන ලද පසුබිම් සාධක සහ මුල් කාලීන අරමුණු

(ලකුණු 10 × 2 - 2

Scanned with CamScanner

(05) පහත දක්වෙන ඕනෑම මාතෘකා දෙකක් පිළිබඳ ව සාකච්ඡා කරන්න.

(1) ඩොනමෝර් ආණ්ඩුක්‍රමය ක්‍රියාත්මක වීමේ දී ප්‍රදර්ශනය වූ සාධනීය ලක්ෂණ සහ නිශේධනීය ලක්ෂණ

(2) සුළු ජන කොටස්වල ආරක්ෂාව සඳහා සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව දක්වා තිබූ ප්‍රතිපාදනය

(3) 1972 ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද ව්‍යවස්ථා අධිකරණය

(4) 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද ශ්‍රේෂ්ඨාධිකරණයේ සංයුතිය හා බලතල

(ලකුණු 10 × 2 = 20)

(06) පහත දක්වෙන ශීර්ෂයන්ගෙන් දෙකක් පිළිබඳව තුලනාත්මක අධ්‍යයනයක් කරන්න.

(1) 1947 සහ 1972 ව්‍යවස්ථා යටතේ ව්‍යවස්ථාදායකයේ නීති සම්පාදන බලය

(2) 1947 සහ 1972 ව්‍යවස්ථා යටතේ දේශපාලන විධායකය සතු වූ නීති ක්‍රියාත්මක කිරීමේ බලය

(3) 19 වැනි සංශෝධනයට පෙර හා පසු පාර්ලිමේන්තුව හා පත් කිරීමේ තනතුරුවලට අදාළ ව ජනාධිපතිවරයාගේ බලතල

(4) 18 වැනි සංශෝධනය මඟින් ස්ථාපිත පාර්ලිමේන්තු සභාව සහ 19 වැනි සංශෝධනය මඟින් ස්ථාපිත ව්‍යවස්ථා සභාවේ සංයුතිය සහ තත්ත්වය.

(ලකුණු 10 × 2 = 20)

(07) පහත සඳහන් මාතෘකා අතරින් ඕනෑම දෙකක් පිළිබඳ ව සාකච්ඡා කරන්න.

(1) 1978 ආණ්ඩුක්‍රමය යටතේ විධායකය හා ව්‍යවස්ථාදායකය අතර සම්බන්ධය.

(2) 18 හා 19 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන අතර පවත්නා වෙනස්කම්

(3) 1978 ව්‍යවස්ථාව යටතේ අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳ න්‍යාය හා භාවිතය. (ලකුණු 10 × 2 = 20)

## III කොටස

(08) පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් පිළිබඳව විශ්ලේෂණය කරන්න.

(1) සංඝීය ආණ්ඩුක්‍රමයක වාසි අවාසි

(2) සමූහාණ්ඩුවාදය

(3) ඒකීය ආණ්ඩුක්‍රමයක ලක්ෂණ

(ලකුණු 10 × 2 = 20)

(09) පහත සඳහන් ඕනෑම මාතෘකා දෙකක් පිළිබඳ සාකච්ඡා කරන්න.

(1) ගැටුම්වල සාධනීය හා නිශේධනීය ඇඟිවීම්

(2) ගැටුම් පරිවර්තනයේ දේශපාලන පරිසරය

(3) ගැටුම් ජීවන චක්‍රය (Conflict life cycle)

(ලකුණු 10 × 2 = 20)

(10) පහත දක්වෙන ඕනෑම මාතෘකා දෙකක් පිළිබඳව අදහස් ඉදිරිපත් කරන්න.

(1) ලෝක සාමය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මැදිහත් වීම.

(2) සාර්ක් සංවිධානයේ අරමුණු සහ ඒවා ඉටු කිරීමට ඇති බාධක

(3) මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය නොවන සංවිධානවල දායකත්වය

(4) 2015 න් පසු ශ්‍රී ලංකා විදේශ ප්‍රතිපත්තියේ මූලික ලක්ෂණ

(ලකුණු 10 × 2 = 20)

Scanned with CamScanner